Australian Government
Department of Home Affairs

# කෝවිඩ්-19 පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර

ඔබට වීසා බලපත්‍රයක් නැති වුවද, නැතිනම් ඔබගේ වීසා බලපත්‍ර තත්වය සම්බන්ධයෙන් පැහැදිලි නැතිවුවද, ඔබ විසින් මහජන සෞඛ්‍යය විධාන අනුගමනය කල යුතුය. ඔබට අසනීප නම්, වෛද්‍ය උපදෙස් ලබා කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කර ගන්න.

ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන් මගින් කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර ලබාදීම සිදු කෙරේ.

- ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි
- නිව් සවුත් වේල්ස්
- නොදර්න් ටෙරිටරි
- ක්වීන්ස්ලන්ඩ්
- සවුත් ඕස්ට්‍රේලියා
- තස්මේනියා
- වික්ටෝරියා
- වෙස්ටර්න් ඕස්ට්‍රේලියා

# මා හට විශේෂ කාණ්ඩ වීසා බලපත්‍රයක් ඇත

නවසීලන්ත සහ ඕස්ට්‍රේලියානු පුරවැසියන් හට විශේෂ වැඩපිළිවෙලවල් ඇති අතර ඒ අනුව අප එකිනෙකා හට එකිනෙක රටෙහි රැඳී සිටීමට සහ රාජකාරී කිරීමට හැකියාව ඇත.

## මා හට ඕස්ට්‍රේලියාව තුල කිසිදු උපකාරයක් ලබාගත හැකිද?

ඔබ ආරක්ෂා කරන ලද SCV නවසීලන්ත පුරවැසියෙකු නම් සහ වෙනත් සුදුසුකම් අවශ්‍යතා සපුරන්නේ නම්, ජොබ්සීකර් සහ ජොබ්කීපර් ගෙවීම් ඇතුළු සියළු සුබසාධන ගෙවීම් සඳහා හිමිකම් ලබයි.

ඔබව ආරක්ෂා නොකරන ලද SCV නවසීලන්ත පුරවැසියෙකු නම් සහ TY444 වීසා බලපත්‍රයක් ඇතිනම්, ඔබගේ සේවායෝජකයා ඔස්සේ ජොබ්කීපර් ගෙවීම් සඳහා සුදුසුකම් ලබයි.

## ආරක්ෂා කරන ලද නවසීලන්ත පුරවැසියෙකු යනු කුමක්ද?

පහත කණ්ඩායම්වලින් එකකට ගැනේ නම්, යම් පුද්ගලයෙකු ආරක්ෂා කරන ලද SCV නවසීලන්ත පුරවැසියෙකුවේ:

- 2001 පෙබරවාරි 26 දින ඕස්ට්‍රේලියාව තුල සිටීම
- මෙම දිනයට පෙර වසර 2 ක කාලයකදී ඕස්ට්‍රේලියාවේ මාස 12 ක් සිටීම
- 2004 පෙබරවාරි 26 දිනට පෙර සර්විසස් ඕස්ට්‍රේලියා මගින් ආරක්ෂා කරන ලද SCV ලෙස ඇගයීමක් කර තිබීම.

ආරක්ෂා කරන ලද SCV වීසා බලපත්‍රධාරීන් සම්බන්ධ වැඩිදුර විස්තර සහ උපදෙස් Services Australia website වෙතින් ලබාගත හැකිය.